සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** |

(01) (i) (අ) සීලවතී බිසව

(ආ) ශක්‍රදේවේන්ද්‍රයාගෙන්

(ii) (අ) නෙළුම් විල, මේ ලෝකය තුළ

(ආ) සීතාවක යුගය

(iii) (අ) සිරිසේන

(ආ) තුංමං හන්දිය

(iv) (අ) මේසය මත හිඳිනා ගල සේ

(ආ) මා - කවියා / මිතුරා

ඔබ - දිසාපති

(v) (අ) සුදොවුන් රජ

(ආ) රාහුල කුමරුන් නොකියා ම මහණ කළ නිසා (ලකුණු 4 × 5 = 20)

(02) (1) අත්දැකීම -

ජීවිතයක් ගලා යන අන්දම ප්‍රකාශ කරමින් පියවරින් පියවර ගමන් කරන මාර්ගයක් මගක් උපයෝගී කර ගැනීම. (ලකුණු 05)

(2) අත්දැකිම රසවත් කිරීමට යොදාගෙන ඇති කාව්‍යාලංකාර

උපමා - මගක් නම් - පියවර මතින් - පියවර තබා

- තැනූ මඟක්මයි - මුවදොර සොයා යන ගඟක් මයි

රූපක - විසිතුරු සල්පිල් - වටරවුම් පදිකා

ව්‍යංග්‍යාර්ථ - අතරමඟ ලත නොවී මුව දොර සොයා

යන ගඟක් මයි

මොහොතක් ඉසිඹු ලබනා විනා

නැත අතරමඟ නතරවන වාසනා (ලකුණු 05)

(3) සංකේතාත්මක භාෂාවේ අපූරු බව

මග සංකේත කරමින් රචනා කර ඇති බව

අම්බලන් විසිතුරු - සල්පිල් - ගංගාවන් ආදිය (ලකුණු 05)

(4) ආකෘතියේ උචිත බව

නිසඳැස් ආකෘතිය මගක් පාරක් ආකාරයට

කවිපෙළ පෙළ ගස්වා ඇති අයුරු ප්‍රකාශ කිරීම (ලකුණු 05)

(5) ජීවන දෘෂ්ටිය -

ජීවිතයක් ගලා යන ආකාරය ගඟක් මුහුදක් ලෙස ජීවිතයේ ගැටලු කරදර හමු වී වෙන් වී යයි මං සන්ධිවලින් වෙන් වන්නා සේ නවාතැන් ගැනීම අම්බලන් විසිතුරු සල්පිල්............. මෙහොතක් ඉසිඹුලැම...................... හති අරිමින් ගමන් කිරීම. (ලකුණු 05)

(ලකුණු 25 යි)

## <u>II කොටස</u>

(03) (1) ප්‍රජාපති ගෝතමී බිසව සෝවාන් කරවීම, සුදොවුන් රජු සකෘදාගාමී කරවීම බිම්බා බිසවට චන්ද කින්නර ජාතකය දේශනා කිරීම. (ලකුණු 05)

(2) වොටුනු මඟුලත්, ගෙවදනා මඟුලත්, විවාහ මඟුලත් (ලකුණු 05)

(3) වොටුනු මඟුලත්, ගෙවදනා මඟුලත්, විවාහ මඟුලටත් වඩා එම ත්‍රිත්වය එක අවධියකට පැමිණි කල්හි නිවන් මඟුල උතුම් බැවින් උන්ට පමුණුවාලමි' යි සිතීම. ඒ සඳහා ඔහු කැඳවාගෙන යාම. (ලකුණු 05)

(4) ප්‍රජාපතී කුඩා මෑණියන්ට පු තන කිරි මිල ගෙවාලකන්නාක් සේ, පිය රජ්ජුරුවන් තනතුරෙන් වඩාලන්නා සේ - උපමා

බිම්බා බිසවුන්ගේ තරම මහෞෂධ පණ්ඩිතයන් අවස්ථාව ගෙනහැර පෙන්වා දීම.

උපමා භාවිතය මගින් අවස්ථා රසවත් වීම.

නන්ද කුමරුන් රැගෙන යන ගමනේ විස්තර නොසිතින් ගියත් සිතින්ම සසර ගමනින් නවත්නා හෙයින්............ (ලකුණු 10)

(ලකුණු 25)

නැතහොත්

(1) වස්තු විෂය - යටත් විජිත සමයේ සමාජ අවශ්‍යතාවයක් මුල්කර ගනිමින් ජනතාවට තම යුතුකම් ඉටු කිරීම පිළිබඳව (ලකුණු 05)

(2) සියලුදෙනා එකමුතු වී ලොම් සිදුරක් තරම්වත් අඬදබර නොකර ජයගැන්මට එකතු විම.

(ලකුණු 05)

(3) අතක් පයත් ඔලුවත් වෙන වෙන ම කපාගෙන ගියත් කැවත්, බියගුලු ගතිය අත්හැර අයුක්තියකට අත් ඔසවන්නට එපා යනුවෙනි. (ලකුණු 05)

(4) හැඟීම් දනවන භාෂාවක්

අභිමානයෙන් රට වෙනුවෙන් නැගිටීමට දිරිගැන්වීම

සරල ව්‍යවහාර භාෂාව

විධි ක්‍රියා මිශ්‍ර භාෂාව

කවි උදාහරණ ලෙස ගනිමින් ලියා තිබීම වඩා හොඳයි. (ලකුණු 10)

(ලකුණු 25)

## III කොටස

(04) ● '' ඇත් ඉලත්තියෙන් ගැසූ විට රජ්ජුරුවන් වහන්සේට කියා අත කප්පාලම්............
දුර්මුඛ වූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම්ද ආදී ආඩම්බර කතා.............

- වළන් සක්සකොට දීමේ දී ඒවා ප්‍රතික්ෂේප කිරීම............
ගොතන ලද මල්මාලා කිපී බිම දැමීම.......... අහංකාර බව පෙන්වීම
- කුස රජුට තමා අත්හරින ලෙස පැවසීම '' මෙහි සිට දුක් නොවිඳ නුඹ වහන්සේගේ කුසාවතී නුවරට නැගී ගොස් මා කෙරෙහි................ ''
- නුඹ වහන්සේ වැනි හකුරු පුවක් සේ ආදී කතා කීම.
- ඇය අවසානයේ බෝසතාණන්ගෙන් සමාව අයැදීම. (ලකුණු 15)

(05) උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය

- නංගී සමග වෙසක් පහන සාදන අයුරු බලා සිටීම '' අම්මාගෙන් තැලුම් කා හඬන්ට වූ අපි ආලින්දයේ මුලු දෙකකට වීමු.
- ''ඔව් නංගී අපේ කූඩුව තරම් ලස්සන කූඩුවක් නැහැ............''
- අයියාගේ බැනියමට ගිනි ඇවිලුණු විට නංගීත් මාත් ආරම්භ කළ ඇඬුම අපි නොනැවැත්වීමු.....
- කරත්තය පමා වන්නේ අයියා දොස්තර ගෙදරදී මළ හෙයිනැ' යි මට සිතිණි.
ආදී ළමා මනසේ ක්‍රියාකාරීත්වය දෘෂ්ටි කොණය මගින් රසවත්ව ඉදිරිපත් වී ඇති බව
(ලකුණු 15)

(06) විපුල ගුණැති මහතුන් හට පත් විපත..........
කුරිරු ගොරසපුන්ගේ දළ ගෙහි විසය.........
පරසිඳු පබු දනන් සෙව් පමණින් මහරු............ සතුන්ගේ චර්යා ඇසුරින් උපදෙස් ලබා දීමට හැකි වී ඇති බව. (ලකුණු 15)

(07) මනාලිය පිළිබඳ කවියාගේ සිතුවිලි පාඨක සිතේ සංකල්පනා මවා පායි -

හිසනමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවාගති

දූල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඇය ගේ පුරා ඇවිදින විට දූනෙන සිතුවිලි

මා වෙත එතත් ඈ
වුවමනාවක් කිසිත් නැතිවද
නොරුඳෙයි, පලා යයි..

පෙනෙයි ඈ
ඇසෙයි
දූනෙයි
මට ගේ හැමතැන

ඉහත කවි පාද සංකල්ප රූප මවා පායි. කවියා අත්දැකීම් රසවත් ව සාර්ථක ව රචනා කිරීමට මේ අපූරු බව ඉවහල් කරගෙන ඇත. (ලකුණු 15)

## පිරිවිතර වගුව

**සාහිත්‍ය රසාස්වාදය** **11 ශ්‍රේණිය**

| | අධ්‍යාපනික අරමුණු විෂය ක්ෂේත්‍රය / නිපුණතා මට්ටම | දැනුම | අවබෝධය | භාවිතය | විශ්ලේෂණය | සංස්ලේෂණය | ඇගයීම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1.0 සිංහල සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය. | 01 | 01 | | | | | 02 |
| 2 | 5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රස විඳිමින් විචාරය කිරීම. | | | | 01 | | | 01 |
| 3 | 2.0 - 5.0 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය හා නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කිරීම. | | | 01 | | | | 01 |
| 4 | 2.0 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | | | 01 | 01 |
| 5 | 3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | | 01 | | 01 |
| 6 | 2.0 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | | | 01 | 01 |
| 7 | 5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | 01 | | | 01 |
| | එකතුව | 01 | 01 | 01 | 02 | 01 | 02 | 08 |